# උදාගම් සංවාදය

අග්‍රාමාත්‍ය
ආර්. ප්‍රේමදාස

BKT 0170
26/08/2023

ජනාධිපති කාර්යාලය
පුස්තකාලය

# උදගම් සංවාදය

අග්‍රාමාත්‍ය
ආර්. ප්‍රේමදාස



‘අපි ආදර්ශ ගම්මාන හදන්න පටන් ගත්තේ නිවාස පහසුකම් ලබා දෙන්න පමණක් නොවෙයි. අපෙන් අතුරුදහන් වෙලා තියෙන ස්වශක්තිය කෙරෙහි විශ්වාසය, කැපවීම, අභිමානය හා ගුණධර්ම නැවත නගා ගනිමින් හීන දීන නියාලු හැඟීම් හා හැසිරීම් දුරින් දුරලන්නයි.’

# උදගම් සංවාදය

(පළාත් පාලන, නිවාස හා ඉදිකිරීම අමාත්‍යාංශයේත්, සර්වෝදය ආයතනයේත් සංවිධානයෙන් මැති ඇමතිවරුන් හා රාජ්‍ය නිලධාරින්ගේ සහභාගිත්වය ඇතිව 1979.10.08 දින දවස පුරා මොරටුවේ සර්වෝදය ආයතනයේ දමසක් මන්දිරයේ පැවති උදගම සංවාදය අරඹමින් අග්‍රාමාත්‍ය, පළාත් පාලන, නිවාස හා ඉදිකිරීම අමාත්‍ය ගරු ආර්. ප්‍රේමදස මැතිතුමා කළ කථාව)

ඇමතිතුමනි, දිසා ඇමතිවරුනි, ආරියරත්න මහතාණනි, පළාත් පාලන, නිවාස හා ඉදිකිරීම අමාත්‍යාංශයේත් අනිකුත් අමාත්‍යාංශවලත් නිලධාරි මහත්වරුනි, නෝනාවරුනි. මා ප්‍රථමයෙන්ම සර්වෝදය ආයතනයටත් එහි නායක ඒ. ටී. ආරියරත්න මහතාටත් එහි සියලුම නිලධාරි මහත්වරුන්ටත් නෝනා මහත්වරුන්ටත් ස්තුතිවන්ත වෙනවා, අද දවසේ අපට මේ සංවාදය සඳහා අවකාශ ලබාදීම ගැන. මේ සංවාදය විධිමත් පරිදි පැවැත්වීමට සංවිධාන කටයුතු මෙහෙයවීම ගැන අමාත්‍යාංශයේ අතිරේක ලේකම් ආචාර්ය අබේවර්ධන මහතාටත් ඒ. ටී. ආරියරත්න මහතාටත් මගේ ස්තුතිය හිමිවිය යුතුයි.

මට උවමනා කළේ උදගම් වැඩපිළිවෙලට සම්බන්ධ රජයේ නිලධාරීන්ට අපේ බලාපොරොත්තුව, අරමුණ හා පරමාර්ථය ගැන තේරුම් කර දෙන්න. ඇතැම් තැනක රජයේ නිලධාරීන් අපේ අදහස තේරුම්ගෙන නැති බව පෙනුනා. ඒ අය හිතල තියෙන්නෙ මේ උදගම් ව්‍යාපාරය නිකම් මේ රජයේ තවත් වැඩ පිළිවෙලක් පමණයි කියල. එහෙම හිතල කටයුතු කරපු තැන්වල වුනේ ශ්‍රමය, ද්‍රව්‍ය, යන්ත්‍රෝපකරණ නාස්තියක්. ඒ අය හිතුවේ නෑ මේ වැඩපිළිවලේ විශේෂත්වයක්. අපි මේක ආරම්භ කරල දැන් අවුරුද්දකුත් මාස තුනක් විතර වෙනවා. අපේ වැඩ පිළිවෙල ගැන ආපසු හැරිල බලන්න ඕන අවස්ථාව උදවෙලා. වැරදි තියනවා නම් හදගන්න ඕන. සාකච්ඡා කරල විවේචනවලට කන්දිල හදගන්න ඕන.

## ත්‍රි ලක්ෂණ

මුලින්ම කියන්න කැමතියි මේ ආදර්ශ ගම්මාන වැඩපිළිවෙලේ පරමාර්ථය මොකක්ද කියල. දිළිඳු නොදියුණු අහිංසක පුරවැසියන්ට හොඳ ජීවන තත්ත්වයක් උද කර දිය යුතු බවට කිසිම සැකයක් නෑ. එයට නිවාස, ජලය, ඒ වගේම ජීවනෝපාය මාර්ග හද ගන්න ඕනෑ. නමුත් එපමණක් නොවෙයි අපේ පරමාර්ථය. ඊට වඩා ගැඹුරු පරමාර්ථයක් ඇතිවයි අපි මේ ව්‍යාපාරය ආරම්භ කළේ. කාලයකට පෙර හිතේ පිළිසිඳ මෝරා වැඩුණු සංකල්පනාවක්. විශේෂයෙන් විරුද්ධ පක්ෂයේ හිටපු අවුරුදු හතේ මේ ගැන කල්පනා කළා. අපේ ජනතාවගේ ආධ්‍යාත්මික ගුණවගාවත්

සමෘද්ධියත් මානුෂික නිදහසත් පිණිස මොන විධියේ ක්‍රියා මාර්ගයක් අනුගමනය කළ යුතු ද කියා. ජනාධිපතිතුමාගේ නායකත්වයෙන් මැතිවරණ ව්‍යාපාරය ගෙන යන අවස්ථාවේ දී රට වටා ගොස් අපි කිවේ දේශපාලන වශයෙන් නිදහස්, ආර්ථික වශයෙන් සමෘද්ධිමත්, ආධ්‍යාත්මික වශයෙන් දැහැමි සමාජයක් ගොඩ නගන්න ඕනෙයි කියල. ඒ වෙලාවෙ බොහෝ දෙනා හිතුව අපි ඉදිරිපත් කළේ දේශපාලන තුරුම්පුවක් කියල. අපිට බලය ලැබුණාට පස්සෙත් රජයේ නිලධාරින් හුඟදෙනෙක් හිතුව 'අමුත්තක් නෑ, පුරුදු විදියටම කර ගෙන යන එකයි' තියෙන්නේ කියල. 'පාරක් හදන්න කිව්වොත් ඔහෙ පාරක් හදනවා. ගෙයක් හදන්න කිව්වොත් ඔහෙ ගෙයක් හදනවා. සල්ලි දෙනව නම් ඔහෙ කරන එකයි තියෙන්නෙ. ළඟට ආවොත් මල්මාලයක් දල පිළිගනිමු. ළමයි ටිකක් දල අභිනන්දන ගීතයක් ගායනා කරමු. සැලියුට් එකක් නෙමෙයි දහදෙළොස් පාරක් දමු. ඔහේ ඇවිල්ල ගියාවෙ. අපි ඔහේ පුරුදු විදියට වැඩ කරමු.' මෙකයි සම්ප්‍රදය.

අපේ බලාපොරොත්තුව එහෙම දෙයක් නොවෙයි. රජයේ නිලධාරින් හැටියට තමුන්නාසේලා වැටුප් ලබනවා. මා හිතන්නේ නෑ තමුන්නාන්සේලාට භාරදී තියෙන වැඩ ගැන කල්පනා කරන කොට වැටුපකින් වන්දි ගෙවන්න පුලුවනි කියල. ඒ තරම් වගකීම සහිත භාරදූර කාර්යයක් තමයි තමුන්නාසේලා කරන්නෙ. තමුන්නාසේලාට යැපීමක් දෙනවා. ඒ යැපීම අනුව නොවෙයි තමුන්නාසේලාගේ රාජකාරිය මනින්න පුලුවන් වෙන්නෙ . අපේ වැඩපිළිවෙලට යැපීමට වඩා කැපවීම අවශ්‍යයි. අපේ නව පරපුර අපේ කලින් පරපුරට වඩා ගුණ දහමින් උසස් පරපුරක් කරන්ට අපට අවශ්‍යයි. කතා කර කර හිටියට වැඩක් නෑ. අපි ක්‍රියාත්මක වෙමු. අපට එය ක්‍රියාත්මක කළ හැකියි.

## සවශක්තිය

ජනපද ව්‍යාපාරය ආරම්භ වුනේ මොන තරම ශ්‍රේෂ්ඨ පරමාර්ථයකින්ද ? රජය හැමදේම දුන්නා. ගොඩින් මඩින් ඉඩම් දුන්නා. ගෙවල් හදල දුන්නා. හරකබාන දුන්නා. මිනිසුන් පදිංචි කෙරෙව්වා. එහෙම කංල උළුකැටයක් බිදුනහම ඒක හදගන්න උත්සාහ නොකර රජයේ උදව් ඉල්ලුව. තනිකර වහල් ආකල්පයක්. ස්වශක්තිය කෙරෙහි විශ්වාසයක්, බලාපොරොත්තුවක් නෑ. වෙන කාටවත් ඕන විදියට ජීවත් වෙනවා. නිදහස ලැබිල මෙච්චර කලක් ගිහිල්ලත්, මේ වහල් ආකල්පය කුසීත හැඟීම අප බොහෝදෙනාගෙන් ඈත්වෙලා නෑ. කවුරු හරි පිහිට වෙන්න ඕනෑ. ආණ්ඩුව පිහිට වෙන්න ඕනෑ. ආණ්ඩුව කියන්නෙ අපිය කියන හැඟීම තවම පහළ වෙලා නෑ. අනුන්ගේ වරද පේනවා, හොයනවා. තමන්ගේ වරද දකින්නෙ නෑ. හොයන්නෙ නෑ. අපි පොඩ්ඩක් අප ගැනත් හිතමුද ? සමාජය හදන්න ඉස්සෙල්ල අපි හැදෙමු ද? අපි හැදුනොත් සමාජයක් හැදෙනවා කියන එක මට සහතිකයි. සමාජය හැදෙන්නෙ මිනිසුන්ගෙන්.

ජනාධිපති කාර්යාලය
පුස්තකාලය

මිනිසුන් කියන කොටසට මමත් ඇතුළත්. ඉස්සරවෙලා "මම" කියන එක්කෙනා හද ගන්න ඕනෑ. කාටවත් බෑ "මම" හදන්න. "මම" හදගන්න ඕන මමමයි. නිදගන්න ඉස්සෙල්ලා එක විනාඩියක් තමන් ගැන ආවර්ජනය කරල බලමුද ? මං අද කොච්චර බොරු කළා ද, මං අද හෘදය සාක්ෂියට එකඟව ඇත්ත කළාද කියල. අපි මේ විදියට ස්වයං විවේචන තුළින් ගුණ ධර්ම වඩා ගන්න ඕනෑ. ඒ තුළින් රටත් වඩා ගන්නට ඕනෑ.

## සර්වෝදය

ලාභ අපේක්ෂාවෙන් තොරව නිස්සරණාධ්‍යාශයෙන් යුතුව කැපවීමකින් ක්‍රියාකරන සංවිධානයක් ලංකාවේ තිබෙනවා නම් ඒ සර්වෝදය සංගමය බව මම අවංකවම ප්‍රකාශ කරනවා. අපි සර්වෝදයෙන් ආදර්ශය ලබා ගන්න ඕනෑ. අපේ උදගම් ව්‍යාපාරය තරමක් දුරට යනකොට මං ආරියරත්න මහත්මයාට කිව්ව මේ ගැන හොයල බලන්න, අඩුපාඩුවක් තිබෙනවා නම් අවංකවම කියන්න කියල. බොහොම සන්තෝෂයි. ගැඹුරටම නිරීක්ෂණය කරල මහාචාර්ය නන්දසේන රත්නපාල මහතා ඇතුළු පිරිසක් වාර්තාවක් ඉදිරිපත් කළා. ඒ වාර්තාව මං කියවල බැලුව. අපේ නිලධාරීන් හුඟ දෙනෙක් පරමාර්ථය හරිහැටි තේරුම් ගෙන නැති වගයි පේන්නෙ. මෙක ආදර්ශය පදනම් විය යුතු වැඩ පිළිවෙලක්. ලෙඩඩු! වැඩිය ඉන්නෙ මානසික ලෙඩඩු! ගමේ අහිංසක උදවියට නොයෙක් ප්‍රශ්න තිබෙනවා. ඒ අහිංසකයින්ගේ ප්‍රශ්න විසඳන්න අපි කොළඹින් නිලධාරීන් යවනවා. ඒ ගොල්ලො, බොහොම දෙනෙක්, ගිහිල්ල මොකද කරන්නෙ ? විෂබීජ ටිකක් දල එනවා. මට හිතෙනවා ඒ ගොල්ලො නොයනවා නම් වඩා හොඳයි කියල. තව කෙනෙක්ගෙ අමාරුවට සහනයක් සලසන්න ගිහින් තමන්ට තියෙන අමාරුව එතෙන්ට ගිහින් කියනවා.

අපි හිතට ගත්තොත් අධිෂ්ඨානය කර ගත්තොත් අවංක වුනොත් අපිට කරන්න බැරි දෙයක් මේ ලෝකේ නෑ. කතා කළාට මදි. ක්‍රියාත්මක වෙන්න ඕනෑ. ආදර්ශමත් වෙන්න ඕනෑ. අවංක වෙන්න ඕනෑ. අනික් උදවිය තුළ විශ්වාසයක් ඇතිවන පරිදි හැසිරීමක් තියෙන්නට ඕනෑ. අනුන් තුළ විශ්වාසයක් ඇති කරන්නට නම් ඉස්සෙරවෙලා තමන් තුළ විශ්වාසයක් තිබිය යුතුයි. මෙහෙම හිතට අරගෙන වැඩ කළොත් අපේ රට හදන්න, අපේ මිනිසුන් හදන්න අප තුළ තියෙන ශක්තිය හා අප තුළ තියෙන සම්පත් හොඳටම ඇති.

මොනම රටකටවත් අතපාන්නෙ නැතිව ජනතාවත් රටත් නගා සිටුවා ගන්න අපට පුළුවන්. අර මා මුලින් කියාපු හීන දීන වහල් හැඟීමෙන් අපි මිදෙන්න ඕනෑ. ජීප් රථ නැතිලු, යන්ත්‍ර නැතිලු, පහසුකම් මදිලු, වැඩක් නොකර ඉන්න විදිය තමයි හිතන්නෙ. කරන විදිය හිතන්නෙ නෑ. මොන විදියකින්වත් හිතන්නෙ නෑ වැඩක් කරන්න පුළුවන් විදියක් ගැන. දීන කල්පනාව. අදීන කල්පනා පහළ වන්නෙම නෑ. මේ පරාජිත හීන දීන හැඟීම් තියාගෙන ඉස්සරහට යන්නෙ කොහොමද ? අපි මේ හැඟීම් වෙනස් කර ගන්න ඕනෑ.

අපි ආදර්ශ ගම්මාන හදන්න පටන් ගත්තෙ මම මුලින් කිව්ව වගේ නිවාස පහසුකම් ලබා දෙන්න පමණක් නොවෙයි. අපෙන් අතුරුදහන් වෙලා තියෙන ස්වශක්තිය කෙරෙහි විශ්වාසය, කැපවීම, අභිමානය හා ගුණධර්ම නැවත නගා ගනිමින් හීන දීන නියාලු හැඟීම් හා හැසිරීම් දුරින් දුරලන්නයි.

## ආදර්ශය

රජයෙන් වැඩක් කෙරෙනවානම් මම කියන්නෙ ඒක රජයෙන් කෙරෙන වැඩක් බව අඟවන්නෙවත් නැතිව කෙරෙන්න ඕනෑ බවයි. මහජනයාගේ ඉල්ලීමට, උවමනාවටම කෙරෙන කාර්යයක් හැටියට කෙරෙන්න ඕනෑ. රජයේ නිලධාරීන් ඉස්සරහට යන්න උවමනා නෑ. ජනතා සහභාගිත්වය, ජනතා උවමනාවන් පෙරමුණේ තියෙන්න ඕනෑ. අපි හිතනවා ඒ ගොල්ලන්ට තේරෙන්නෙ නෑ, අපිම මේක කරල දෙන්න ඕන කියල. කරල දෙන්න බැරුව නෙවෙයි. එහෙම වුනාම වෙන්නෙ අර වහල් මානසිකයෙන් ජනතාව මුදගන්න කවදාවත් නුපුළුවන් වෙන එකයි. එතකොට ස්වශක්තිය කෙරෙහි ස්වබුද්ධිය කෙරෙහි ස්වඋත්සාහය කෙරෙහි විශ්වාසයක් ජනතාව තුළ ඇතිවෙන්නෙ නෑ. අපිට බැරිද රාජ්‍ය තාන්ත්‍රික කටයුතුවල දී සාම්ප්‍රදායික ක්‍රමයෙන් පොඩ්ඩක් අත් මිදෙන්න ? පොඩි කැපවීමක් කරන්න. අඩු ගානෙ, උදගම් සංකල්පය ක්‍රියාත්මක කරන විට දී වත් ආදර්ශමත් පරිදි කටයුතු කරන්න. අපි මේ රාජකාරි කටයුතු සේවයක් හැටියට කරමුද ? මේ සේවය කොහොමහරි කරන්න ඕනෑ. කරන්න පුළුවන්. බලාගෙන ඉන්න අයට ආදර්ශවත් විදියට කරන්න ඕනෑ. ජනතාවට සේවය කරන්න ඕන විදියට කරන්න ඕනෑ. අපේ පොදු ජනතාව ඉතාමත් හොඳයි රත්තරන් ජනතාවක් මේ රටේ ඉන්නවා. යමක් හරියට කෙරෙන බව පෙනුනොත්, ආදර්ශයක් ලැබුනොත් ඒගොල්ල අප අනුකරණය කරාවි. අප ආදර්ශයට ගනීවි. දූෂණයයි බොරුවයි තමා ජනතාවට පෙන්නන්ට බැරි. එකක් කියනවා, එකක් කරනවා. කැපවීමක් පේන්න නෑ. ජනතාව තුළ විශ්වාසයක් ධෛර්යයක් ඇතිවෙන්නෙ කොහොමද ?, සර්වෝදය ශ්‍රමදාන ව්‍යාපාරය ගැන බලන්න. එහි ශ්‍රමදායකයින් ලංකාව පුරා විසිරිලා මහ කැපවීමකින් ක්‍රියා කරනවා. ඔවුනට වැටුප් ගෙවන්න ගියොත් ලංකා ආණ්ඩුවෙ මුදල් මදිවේවි. දිප ව්‍යාප්ත විශාල වැඩ පිළිවෙලක්. සුළු සුළු අඩුලුහුඩුකම් ඇති. මොන වැඩ පිළිවෙලෙද එහෙම නැත්තෙ? බුද්ධ ශාසනය තුළත් තිබුණ.

## උදගම

අපි උදගම් ව්‍යාපරය ඇරඹුවෙ යාපහුව ආසනයේ බඩල්ගමින්. එකපාරට ඒගොල්ලන් මෙ වැඩපිළිවෙලට නම්මා ගන්න බැරි නිසා අපි ඒ ගොල්ලන්ට ගෙවල් හදල දුන්න. අනික් පහසුකම් සළසල දුන්න. ඒ ගොල්ලොම කුලියට වැඩ කරල ගෙවල්වල පදිංචි වුනා. සාමාන්‍යයෙන් ජීවත් වුනේ සිහමනින්. සිහමන නැති කරන ජීවනෝපාය මාර්ගයක් වශයෙන් කර්මාන්තයක්

ඇති කරල දුන්නා. මුලින් ඒ අය කිව්වෙ තමන් කරගෙන ආපු වැඩෙම (හිහමන) කරගෙන ජිවත් වෙන්න ඉඩ දෙන්න කියල. කියල, කියල, හැම මාසෙම දවස් දෙක තුන ගිහිල්ල කියල, කියල, වෙවැල් කර්මාන්තයට ඒ ගොල්ලන් නැඹුරු කර ගත්තා. ඒ පිමම පැන්නා. දැන් සන්තෝෂයි කියන්න. එක් කෙනෙක් මාසෙකට රුපියල් දහක තරම් මුදලක් උපයනවා. සමහරු ඊටත් වැඩියි. උපාධිධාරියෙක්වත් එච්චර උපයනවාද ? සමහර නීතිඥයෝ උසාවි ගිහිල්ල වෙලි වෙලි ඉඳල නිකන් ආපසු එනවා. උදගම් වැසියෝ දැන් ඊට වඩා හම්බ කරනවා. වෙවැල් කර්මාන්තය ඒ ගොල්ලන්ගෙ පාරම්පරික කර්මාන්තයක්. ඒකයි අපි ඒ ගොල්ලන්ව ඒකට නැඹුරු කළේ. කුඩා කර්මාන්ත දෙපාර්තමේන්තුව මුල දී කල්පනා කළා, වෙවැල් කර්මාන්ත ශාලාවක් උදගමට දල වැඩක් නෑ කියල. වැඩේ ඇත්ත. ඒ ගොල්ලන් පුරුදුවෙලා හිටියෙ රබන් කරක කරකවා අතපාල ඉල්ලන් කාල ජිවත් වෙන්න. අපි බැහැයි කියල අතහැර දැම්මෙ නැහැ. අද ඒ ගොල්ලො තම නිෂ්පාදන භාණ්ඩ විකුණල කොච්චර සල්ලි උපයනවද කිව්වොත් ශුද්ධ ලාබෙනුත් කොටසක් දෙන්න ලැස්තියි. ඒ කොටසත් අපි බෙදුව ඒ ගොල්ලන්ටම. දැන් ගෙවල් බොහොම පිරිසිදුවට තියාගෙන ජීවත් වෙනවා. මෙතෙන්ට සුදුසු නිලධාරියෙක් හොයා ගන්නත් අමාරු වුනා. මාරු කරනවා. බලනවා. අන්තිමේ දී එක්කෙනෙක් හම්බ වුනා බණ්ඩාර කියල. පුදුම දියුණුවක් අද එතන තියෙන්නෙ. සර්වෝදය ශ්‍රමදාන සංගමයෙනුත් තරුණයෙක් දැම්ම සුමිත් කියල. මන් හිතන්නෙ මේ සුමිත් නිසා තමයි එහාට අලුත් ආකල්පයක් ඇතිවෙලා තියෙන්නෙ. මේ තරුණයා පඩියට වැඩ කරන කෙනෙක් නෙමෙයි.

මා ඇහුව එයාගෙන් මොකක්ද ආදයම කියල. එයා කිව්ව ආදයමක් මොකුත් උවමනා නෑ, ජිවත් වෙන්න කෑම ටිකක් අරහෙ මෙහෙ තිබුණොත් ඇති කියල. අනුන්ගෙ ගෙවල් අතුගානවා. පවිත්‍ර කරනවා. සුද්ද කරනවා. මේ තරුණයා ලොකු කැපවීමකින් වැඩ කරන්නෙ. ඒ නිලධාරියත් වැඩ කරනවා. අපේ නිලධාරියත් වැඩ කරනවා. වෙලාවක් බලන්නෙ නෑ. ලාභාපේක්ෂාවන් තකන්නෙ නෑ. අන්න පරිවර්තනය ! අන්න කැපවීම ! අන්න ආදර්ශය ! උදගමට ගියොත් තමුන්නාන්සේලාට දකින්න පුලුවන්.

## ගම් රජය

දැන් ආර්ථික වශයෙන් හරි. දැන් මෙතනට අධ්‍යාත්මික පැත්ත ගේන්න ඕනැ. මේ ගමේ අය දැන් ඔක්කොම එකතු වෙලා තමන්ගෙ රාජ්‍ය ඇති කර ගන්න ඕනැ. තමන්ගෙ ජනාධිපති, තමන්ගෙ අගමැති, තමන්ගෙ කැබිනට් මණ්ඩලය, තමන්ගෙ පාර්ලිමේන්තුව ඇති කරගෙන තමන්ගෙ ප්‍රශ්න තමන් අතරෙම විසඳ ගන්න ඕනැ. තමන්ගෙ විමුක්තිය තමන් විසින්ම සාමූහික ප්‍රයත්නයකින් සාමූහික කැපවීමකින් සළස්ව ගන්න ඕනැ. දයාව,

කරුණාව, මෛත්‍රීය එම පාලනයට ඇඳෙන්න ඕනෑ. සුඛිත මුදිත දැහැමි නිවහල් සමාජයක්. මගේ සීනෙ ඒකයි. බැරි නෑ. පුලුවන්. අපි බලමු. සුමිත්ලට බණ්ඩාරලට මං අරමුණ දීලයි ආවෙ. මං හිතන්නෙ ඒ තරුණයො මෙ වැඩෙත් කොරාවි.

දැන් උදගම් 28ක් විතර හදල තියෙනවා. කවුරුත් කාගෙත් හිතසුව පිණිස එකට එකතු වෙලා වැඩ කළ තැන් සාර්ථකයි. ඒකයි මං අදහස් කළේ ආපසු හැරිල බලල, වැරදිච්ච තැන් හරිගස්සාගෙන ප්‍රතිසංවිධානය වෙලා අවබෝධයකින් යුතුව ඉදිරියට යන්න. රාජ්‍ය තන්ත්‍රයම මෙයට සම්බන්ධ වෙන්න ඕනෑ. ජල සම්පාදනය, සෞඛ්‍ය කටයුතු, විදුලිය බලය ආදී වශයෙන්. ඒකයි මහාමාර්ග විදුලිය බල පිළිබඳ ඇමතිතුමාට මං විශේෂ යෙනුත්, සියලුම දිස්ත්‍රික් අමාත්‍යවරුන්ටත් මෙ සංවාදයට සහභාගි වෙන්නයි කියල මං කිව්වෙ. අපිට පුලුවන් දිස්ත්‍රික් ඇමතිතුමන්ලා මගින් ඒ ඒ ප්‍රදේශ වල මහජන මන්ත්‍රීවරුන් තුළ මේ හැඟීම ක්‍රමය ඇති කරන්න. මෙම වැඩ පිළිවෙලට සම්බන්ධ නිලධාරි මහත්වරුන් කැඳෙව්වෙත් මේ පිළිබඳ කැපවීම වගකීම හා අධිෂ්ඨානය ඇතිකර ගන්නයි.

අපි අවුරුදු ගණනක් වහල්ව හිටියා. අප වහල් වුනේ නිදහස නැතිවීමෙන් පමණක් නොවෙයි. ගුණධර්ම නැති වුණා. නිවට නියාලු හැඟිම මතුවුණා. මිනිස්කම අගේ කොට සළකලා, ගුණධර්ම පුරුදු පුහුණු කරල, අදීන මිනිසුන් හැටියට සාමූහිකව නැගී සිටීමේ අපේක්ෂාවෙන් කටයුතු කළ කාලයේ තමයි ලංකාවෙ ස්වර්ණ යුගය උදවෙලා තිබුණේ. තවමත් ඈත පිටිසර ගම්මානවල මේ හැඟිම් ක්‍රමය යන්තම් ශේෂවෙලා තියෙනව. වෙලා තියෙන්නෙ ආර්ථික වශයෙන් නැඟී සිටින්න ඒ ගොල්ලන්ට ශක්තියක් නැති එකයි. වහළක් හෙවිලි කර ගන්න ඕන වුනාම කවුරුත් එකතුවෙලා වහළ හෙවිලි කළා. එකතුවෙලා කාගෙ කාගෙත් කුඹුරු වැඩ කළා. ගමේ ලෙඩෙක් හැදුනාම පණිවිඩයක් නැතිවම වෙද මහත්තය ලෙඩා හොයා ගෙන ආව. මුදල් බලාපොරොත්තුවෙන් නොවෙයි. කවුරුත් එක්කාසු වෙලා දුවල පැනල බෙත් හොයාගෙන ඇවිල්ල කොටල මිරිකල පොවල ලෙඩා සනීප කළා. බෙත් පොවන්න ඉස්සෙල්ල ලෙඩාට ලෙඩේ සනීපයි. මොකද? තමන් වෙනුවෙන් මුලු ගමක්ම අවදිවෙලා තමන් වෙනුවෙන් වෙහෙසීම ගැන එයාට සතුටක්, තෘප්තියක් ඇතිවෙනවා. නගරය කොහොමද ? ඔන්න ලෙඩෙක් හිටිය ඉස්පිරිතාලෙක. ලෙඩාට හුස්ම ගන්නත් අමාරුයි. එතනට යාලුවෙක් දුවල දුවල ආව. ආපු ගමන් අර හුස්ම ගන්නවත් බැරි ලෙඩාට මෙහෙම කියාගෙන කියාගෙන යනවා. ''වැඩ ඇරිච්ච හැටියෙ මං දුවගෙන ආවෙ. කෝච්චිය අල්ලන්නත් තියෙනවා. මෙන්න දෙඩන් ගෙඩි ටිකකුත් ගත්තා ගේට්ටුව ළඟින්. පුදුම ගණනක්නෙ ඒ යකා මගෙන් ගත්තෙ. වෙලිච්ච දෙඩම්.'' ලෙඩාට කතා කරන්නත් බෑ. හෙල්ලෙන්නත් බෑ. මේ යෝදය ආයිත් කියෝනව.

"මං එහෙනම් යන්නම්. දැන් නොගියොත් කෝච්චිය අල්ලන්න හම්බු වෙන්නෙ නෑ." තිබ්බ දෙඩන් ටික ලෙඩා ළඟින්. පස්සවත් නොබලා දුවගෙන ගියා. ඊට පස්සෙ මොකද වුනේ ? ආව එක්කෙනෙක්. අපි හිතමු එයා ඉස්පිරිතාලෙට පුරුදු කෙනෙක් කියල. ගත්ත අර දෙඩම් ටික. එයා ගෙනාපු දෙයක් වගෙ අරන් ගියා ! ඔන්න ඔහොම තමයි වැඩ ! මොනවද මේ කරන්නෙ ? හෘදය සාක්ෂියට එකඟව අපි මොනවද කරන්නෙ ? කවුරු වත් කියන්න ඕනැ නෑ. හෘදය සාක්ෂියට එකඟව වැඩ කරන්න. ඒ ඇති ! එහෙම නොකළොත් අන්තිමේ ප්‍රතිඵලය බිංදුවයි. නිකම් මුදල් නාස්ති වෙනවා බලා ඉන්න බෑ. එක යන්ත්‍රයකින් කරන්න පුලුවන් වැඩේට යන්ත්‍ර තුන හතර පාවිච්චි කරනවා. වැරදුනොත් කියනවා 'මං මොනව කරන්නද අරයගෙ කෙරුවෙ කියල. ඒක මගෙ දෙපාර්තමේන්තුවට අයිති නැහැ' කියල කියනවා. 'මෙක මගේ අංශයට අයත් වැඩක් නොවෙයි' කියල කියනවා. මං කල්පනා කළා මෙහාටවත් ගෙනැල්ලා මෙහේදී මේ අදහස් ටික තෝරල දෙන්න.

## පෙරමග ලකුණු

මහත්මා ගාන්ධි තුමා ග්‍රාම රාජ්‍ය ගැන කතා කරන කොට, ස්ව රාජ්‍ය ගැන කතා කරනකොට සමහරු හිනා වුනා. අපි ගමේ ඉඳගෙන ගමේ වැඩ කටයුතු ගමේදීම කරගෙන ගමේ විදියට ජීවත්වෙමුයි කියන කොට හිනාවුනා. දැන් ඔන්න මැද පෙරදිග තෙල් ළිං හිඳිගෙන යනවා. තෙල් මිල වැඩිවෙනවා. බොහොම අමාරුයි. දැන් ඔන්න ටික ටික කරුණාව, දයාව, සැහැල්ලු පැවැත්ම ගැන කතාවෙනවා. තෙල හිඳෙනකොට තෙලට යටවෙච්ච යාන්ත්‍රික ජීවිත පෑදෙනවා. මොළෙත් පෑදෙනවා ! දැන් ගව සම්පත ගැන හිතනවා. වන සම්පත ගැන හිතනවා. යන්ත්‍ර පාවිච්චි කළ යුත්තේ මිනිහාට උවමනා ප්‍රමාණයට මිසක් මිනිසාට උඩින් යන්නට නොවෙයි කියල ගාන්ධි තුමා කිව්ව. පොළොව කොතරම් කෘතිම වෙලාද කිව්වොත් රසායනික පොහොර නැතිව පයේ රසයත් නෑ. පැට්‍රල්, ඩීසල්, භූමිතෙල් කුඹුරුවලට කවලම් කරල. ඉස්සර හරකාබානෙන් ගත් වැඩේට දැන් ට්‍රැක්ටර්. හරකුන් නෑ. මරාගෙන කාලා ! කුකුළෙක් ගමක හඩලන්නෙ නෑ. මරාගෙන කාල ! සිවුපදයක් ඔන්චිලි වාරමක් ඇහෙන්නෙ නෑ. වෙරිකාරයෙක් කෑගහල කියන කැත වචනයක් තමයි ඇහෙන්නෙ. අපේ සංස්කෘතිකාංග අපෙන් ඈත් වෙනවා. මැද පෙරදිග තෙල් හිඟය නිසා ඔන්න දැන් ටිකක් මොළේ පෑදිලා. කමක් නෑ ප්‍රමාද වෙලා හරි තේරිච්ච එක.

මෙක අභියෝගයක්. අපේ සංස්කෘතික රටාව අනුව දූහැමෙන් සැහැල්ලු පැවැත්මෙන් ගමේ විදියට ජීවත් වෙනවා නම් තෙල් කාරයින්ට අපිව, හොල්ලන්න බෑ. මේ ප්‍රශ්න ගැන මං හිතුවෙ අද ඊයෙ නො වෙයි. විරුද්ධ පක්ෂේ ඉන්න දවස්වල, හැත්තෑ පහේදි මං ලිව්ව පොතක් "පෙරමග ලකුණු" කියල. මං කියන්නම් එයින් කොටසක් දෙකක් :

"1971 අප්‍රේල් කැරැල්ල නිකන් කජු කිරි කොල්ලන්ගේ වලිප්පු රෝගයක් ලෙස බැහැර නොකළ යුතු ඓතිහාසික සාධක සහිත දේශ පාලන සන්ධි ස්ථානයකැයි මම සිතමි. එය අවස්ථාවාදීන්ගේත්, ගතානු ගතික උද්ධච්ඡ දේශපාලනඥයින්ගේත් ඒ සියල්ලකට වැඩියෙන් බඩේ බිජු තියාගෙන මොරදෙන ඔලු දෙකේ කපටි මාක්ස්වාදීන්ගේත් අමන මගඩි නාටක දැක ඒ කෙරේ උපන් සාධාරණ කෝපයෙන් යුතුව ඔවුන් වහා පිටු දකිනු කැමැති වූ අති ධාවන තරුණ පුබුදුවකිනි. ආත්ම අපේක්ෂා වෙන් තොරව අනන්ත කැපවීම තුළින් හුදෙක් අපූරු නව ලෝකයක සීන සැබෑ කරනු කැමතිව කැත්තට පොල්ල ගෙන සටනට වන් මේ තරුණයන්ගෙන් අප පාඩම් උගත යුතුය. ජීවිත පරිත්‍යාගයෙන් ඉදිරිපත් වූ මේ තරුණයන් හඳුනා නොගත් අපේ ඇතැම් දක්ෂිණාංශිකයෝත්, වාමාංශිකයෝත් ඔවුන් ත්‍රස්තවාදීන් ලෙස හඳුන්වා සමාජ පිළිල සේ බැහැර කළහ. මෙ උගත් පිරිස ආයුධගෙන නැගී සිටියේ හුදෙක් බඩ පුරවා සුඛිත මුදිත ජීවිත ගත කරනු සඳහා නොවේ. වරින් වර රට පාලනය කරන එකම පංතියේ අවස්ථාවාදීන් කෙරෙහි උපන් කෝපයෙනි. එහෙත් ඔවුන් ගියේ නොමඟිනි.

තෘප්තිමත් සමාජයක් බිහිකළ හැක්කේ ජනතාව පාලනයේත්, සංවර්ධනයේත්, නිෂ්පාදනයේත් එමෙන්ම ලාභ ප්‍රයෝජනයේත් නියම කොටස්කරුවන් බවට පත්කර ගැනීමෙන් පමණි. මහපොලවේ උතුමම දායාදය වන මිනිස් ශක්තියෙන් ප්‍රයෝජනයක් නොගෙන එය අපතේ යවන්නට සැලැස්වීමටත්, ඉදින් ප්‍රයෝජනයක් ගත්තත් එය වැරදි විදියට උපයෝගී කර ගැනීමටත් හේතුවී ඇත්තේ සමාජය සංවිධානය කර නැති නිසාය. ස්වකීය පෞද්ගලික දක්ෂතා මගින් මතුවන ජීවන වෘත්තියක් වෘත්තිය කර ගැනීමට හැකිව ඇත්තේ අතළොස්සකට පමණි. එක්කෝ ඔවුහු තම දක්ෂතා ගැන හඳුනාගෙන සිටින නමුත් කවර කාර්යයක් කර හෝ දිවි රැකගැනීමට ඇති උවමනාව නිසා දක්ෂතාවලට පිටුපා වෙනත් කාර්යයන් හි යෙදෙත්. විද්‍යා, කලා හා දර්ශන ක්ෂෙත්‍රවල සිටින කෝටි ප්‍රකෝටි ගණනින් වටිනාකම තක්සේරු කළහැකි ශ්‍රේෂ්ඨ යන්ගේ වටිනාකම නොතකන්නන් වැඩියෙන්ම සිටින රට ලංකාවයයි

සිතමි. ආධ්‍යාත්මික පක්ෂයෙන් චිත්ත ශක්තිය දියුණුකර ගත් පුද්ගලයෝ ඉන්දියාවේ දී ගරු සැළකිලි ලබති. අපේ රජය කලාකරුවකුගේ වටිනාකම තක්සේරු කරන්නේ රුපියල් 500කටය. රට නගන්නට වඩන්නට පේවී සිටින විද්‍යාඥයින්, ඉංජිනේරුවන් හා බුද්ධිමතුන් ද රට හැර යනු බලා මැයිවිලි නගනු මිස ඔවුන් රටහැර යන්නේ ඇයි දැයි ඔවුහු නොසොයති. ආත්මාර්ථය පදනම් කරගෙන බලයට පත්වන කවර ධනවාදී හෝ සමාජවාදී හෝ ආණ්ඩුවකින් යුක්තියත් සාධාරණත්වයත් බලාපොරොත්තු විය නොහැකිය. එවැනි තැනක සිදුවන්නේ සූරාකෑම හා බලය එක් තැනකින් තවත් තැනකට මාරුවීම පමණි. ජනසම්මත වාදය තුළ රාජ්‍ය ආධිපත්‍යයකට හෝ පෞද්ගලික ධනවාදයට හෝ තුන්වැනි ලෝකයේ නව සමාජවාදයට හෝ ඉඩක් නැත. රටක සම්පූර්ණ රාජ්‍ය බලය එක් පිරිසක් අතර පවතින කල එතැන ඇත්තේ පූර්ණ ඒකාධිකාරයකි. වෙනත් තැනක සඳහන් කළ අන්දමට දේශපාලන බලය ග්‍රාම රාජ්‍ය දක්වා විමධ්‍යගත කළ ලෙසින්ම මෙහිදී ද ධනය විමධ්‍යගත කළ යුතුය. එයින් අදහස් කරන්නේ ජාතික ධනෝපායන මාර්ග ලම්බාකාරව රජයත්, රජයේ හිතවතුනුත් හා සංස්ථා හා සමාගම් ද අතර බෙදහැරීමක් නොව සමාන්තරව ජනතාව අතර බෙද හැරිය යුතු බවය. මෙහිදී රජය ජනතාව වෙත සම්බන්ධිකරණ බලය ක්‍රියාත්මක කරනු විනා ඒකාධිකාරි ස්වරූපයක් නොපැවැත්විය යුතුය. ධනය නිර්ධනයන් සතු කිරීමේ ව්‍යාජයෙන් රාජ්‍ය සන්තක කිරීමකට හෝ ඒ පුද්ගලයන් අතලොස්සකට පැවරීමකට හෝ ජනසම්මත වාදය තුළ අවකාශයක් නැත. එක් පංතියකින් ධනය උදුරාගෙන තවත් පංතියකට එය බෙදදීමෙන් සමාජවාදයක් බලාපොරොත්තු විය නොහැකිය. ධනය ඉහළ සිට පහළට හෝ පහළ සිට ඉහළට හැරවීමක් නොකොට, මුළු මහත් ජනතාවටම ඔවුනොවුන්ගේ හැකියාවන් අනුව පලප්‍රයෝජන ලැබිය හැකි වන පරිද්දෙන් සමාන්තරගතව බෙදී යන ක්‍රමයක් ඇති කළ යුතුය. දැන් පවත්නා අන්දමට කම්කරුවන්ගේ ශ්‍රමය කුලියක් පමණි. පාලනයට ඔවුන්ගේ සහභාගිත්වයක් නොමැත. කිසියම් ව්‍යාපාරයක් හෝ කර්මාන්තශාලාවක් හෝ රජ සතු කිරීමේ දී කම්කරුවකුගේ ශ්‍රමයෙහි වෙනසක් සිදු නොවේ. දිගටම ඔහුගේ ශ්‍රමය කුළියකට සීමාවේ. කම්කරුවා එවැනි රජ සතුවකට කැමති වන්නේ තමන්ගේ ශ්‍රමය අඩුවෙන් වැය කරන්නට ලැබෙන ඉඩ ප්‍රස්ථාවය ගැන හා පෞද්ගලික ඉල්ලීම් දිනාගැනීමට ලැබෙන පහසුකම් ද සළකාගෙන විය යුතුය. නියම නිවැරදි ජනසතුවකදී කම්කරුවකුගේ ශ්‍රමය ධනයක් ලෙසින් ගෙන ඔහුද එම ව්‍යාපාරය හෝ කර්මාන්තයේ කොටස්කරුවෙක් කරගත යුතුය. එවිට ඔහු සේවයට පමණක් නොව පාලනයට හා ලාභයට ද කොටස් කරුවෙක් වේ. වර්ජන තර්ජන ඇති වන්නේ සේව්‍යයාත් සේවකයාත් අතර ඇති පරතරය නිසාය.''

## සමාජය නිදල්ලේ වැඩෙයි

ලංකාවෙ ගම්වලින් සංවර්ධනය ආරම්භ විය යුතුයි. අද ඔක්කෝම නගරයේ. නිෂ්පාදන මධ්‍යස්ථානයත් නගරයේ. අළෙවි මධ්‍යස්ථානයත් නගරයේ. හැම දේකටම මධ්‍යස්ථානය නගරය. ගමෙන් අමු ද්‍රව්‍ය ගෙනැල්ලා නගරයේ නිෂ්පාදනය කරනවා. ගම්මුන්ට සිද්ධවෙලා තියෙන්නෙ නගරයට ඇවිල්ලා ඒව මිලදී ගන්න. අමු ද්‍රව්‍ය තියෙන්නෙ ගමෙ. ගමෙ නිෂ්පාදනයක් නැ. ගම නිෂ්පාදන මධ්‍යස්ථානය වෙන්න ඕනෑ. නගරය අළෙවි මධ්‍යස්ථානය වෙන්න ඕනෑ. මොකද උනේ ? ඔක්කොම ගම් දනව් අත්හැර දල නගරයට ඇදෙනවා. නගරය මුඩුක්කුවක්. නගරයට ඇවිත් ගමෙ අය ලෙඩ රෝග ගමට අරන් යනවා. හැම තැනම ලෙඩ්ඩු. හැම තැනම අසහනය. හැම තැනම දූෂණය. හේතුව සමාජයට නිදල්ලේ වැඩෙන්ට ඉඩ හැරිමයි. නියම එල්ලයක් පරමාර්ථයක් ඔස්සේ සමාජය සංවිධානය කළ යුතු යැයි මා කියන්නේ ඒ නිසයි.

ඒ නිසා අපි කවුරුත් සාකච්ඡා කරල අපෙ ගමන් මාර්ගය සකස් කරගන්න ඕනෑ. ග්‍රාමෝදය ව්‍යාපාරය මාර්ගයෙන් මෙය කරන්නයි අපි බලා පොරොත්තු වන්නේ. මෙතනින් හරියට පටන් ගත්තොත් අපිට පුලුවන් හැම ක්ෂෙත්‍රයකටම පතුරුවන්න. මේ වැඩේට රට වැසියන් පමණක් නොවෙයි රාජ්‍ය තන්ත්‍රයේ නිලධාරිනුත් ඕනෑ. ඒ නිලධාරින්ට අපෙ දර්ශනය ගැන පැහැදිලි අවබෝධයක් තිබිය යුතුයි. ඔය ගම්භිර පැවතුම්, ගම්භිර වැඩ හුඟාක් කල් රඳා පවත්වා ගන්න ලැබෙයි කියල හිතන්න බැහැ. අපිට වඩා පොහොසත් රටවලුත් දූන් දන බිම ඇණගෙන ඉන්නවා, ගම්භිර ජීවිත ගෙනියන්න බැරුව. අඩි හතරක් පයින් යන්න බෑ. බස් ඕනෑ. වාහන ඕනෑ. පිටිසර පළාත්වල හැතැප්ම දහය පහළොව පයින් යනවා. ඒ ප්‍රදේශවල ලෙඩත් අඩුයි. අපි ආදර්ශමත් විය යුතුයි. අපිව දකිනව මිනිස්සු. බලාගෙන ඉන්නවා අපි දිහා—තමුන්නාන්සේලා දිහාත් අපි දිහාත්.

## සැළසුම් ගැන

ජනතාව හදන්න, ජනතාවට ආදර්ශය දෙන්න ඉන්න අපි අලුතෙන් හිතල, අලුතෙන් ක්‍රියාත්මක වෙන්න ඕනෑ. උදගම් වැඩ කටයුතුවලදී අවස්ථා හතරක් මට පෙනිල තියෙනවා. එක අවස්ථාවක් තමයි, සැලසුම් කිරීම. ඒක නුවණින් කරන්න ඕනෑ. හුඟාක් දේ තියෙනවා කල්පනා කරන්න. නිකම් අර පැත්තෙන් ඉස්කෝලෙ දූම්ම. මෙ පැත්තෙන් ප්‍රජා ශාලාව දූම්ම. කොහෙන් කොහෙන් හරි ගෙවල් දූම්ම. ඒක නෙමෙයි කරන්න ඕනෑ. ගම්මුන් එක්ක කතා කරන්න ඕනෑ. අපි මෙ ඉෂ්ඨ කරන්නේ ඒ ගොල්ලන්ගෙ අවශ්‍යතාවයන්. ඒ ගොල්ලන්ගෙ කැමැත්තට අපි මුල්තැන දෙන්න ඕනෑ. දෙවැනි අදියර තමයි ගම හැදීම. කැපවීම, සාමූහික විශ්වාසය හා එකතුව එතෙන්දි එකතුවෙන්න ඕනෑ. ඒක ගැමියන්ගෙන් පමණක් බලාපොරොත්තු වුනාට මදි. නිලධාරින්ගෙනුත් එය ලැබෙන්න

ඕනෑ. නිලධාරින්ගෙ දේශපාලනඥයින්ගෙ කැපවීමක් නැත්නම් ජනතාව ගෙන් කැපවීමක් බලාපොරොත්තු වෙන්න බැහැ. ගෙවල්වල පදිංචිවෙන්න ඉන්න අයගෙ හැඟීමක් ඇතිවෙන්න ඕනෑ මෙක මං හදගන්න ගෙයක්. අපි එයාට සහයෝගය දෙන්න ඕනෑ. එයාට එයා ගැන විශ්වාසයක් ඇති කරන්න ඕනෑ. තුන්වැනි අවස්ථාව වන විවෘත කරන අවස්ථාවේදි ඒ ජනතාව නින්දකින් අවදිවුනාම වගේ—නව ප්‍රබෝධයකින්—නව සිතුවිලි ක්‍රමයකින්—අධිෂ්ඨාන ශක්තියකින්—විශ්වාසයකින් අවදිවෙලා තියෙන්න ඕනෑ. හතරවැනි අවස්ථාව ඊට පස්සෙ. ගුණ ධර්මත් එක්ක ආර්ථික විමුක්තිය උදකළ යුත්තේ මෙ හතරවැනි අවස්ථාවේදි. මේ අවස්ථාවත් අමාරුයි. දූඩි සුපරික්ෂාකාරිත්වයකින් පසුවෙන්න ඕනෑ. එක ගමක ආදර්ශයක් තවත් ගමක ආදර්ශයට වෙනස් වෙන්න පුලුවන්. එය සමාජය පුබුදන, ආර්ථිකය නංවාලන, සංස්කෘතිය ඔපමට්ටම් කරන නැවුම් සංකල්පනාවක් විය යුතුයි. එක ආදර්ශ ගමක ආදර්ශයක් තවත් ආදර්ශ ගමකදී කොපි කළොත් ඒ ගමෙන් ගන්න ආදර්ශයක් නෑ. එතන තියෙන්නේ අනුකරණය. ඒකයි මං කියන්නෙ, ඒ ඒ ප්‍රදේශයන්ට ඒ ඒ පුද්ගලයින්ට සුවිශේෂ වන පරිදි උදගම් සංකල්පය ක්‍රියාත්මක විය යුතු යයි කියා.

## චීනයෙන් අපට

චීනයේ තියෙන්නෙ සම්පූර්ණ මාක්ස්වාදී වැඩපිළිවෙලක් නොවෙයි. මෑතකදී චීනයට ගිය වෙලාවෙ මං මේ බව පැහැදිළිව තේරුම් ගත්තා. මාක්ස්වාදයෙ තියෙන්නෙ අවුරුදු සිය ගානකට ඉස්සෙල්ල යුරෝපයේ ඇතිවෙච්ච ආර්ථික පරිහාණියට පිළිතුරක්. මාවෝ සේතුං ආර්ථික ප්‍රතිපත්තියක් හැටියට මාක්ස්වාදය පිළිගත්තත් එතුමා චීන ජනතාව මෙහෙය වූයේ මාක්ස්වාදය අන්ධ ලෙස අනුකරණය කරමින් නො වෙයි. දේශානු රාගයෙන් යුතුව ස්වශක්තියෙන් නැගී සිටිනු පිණිස එතුමා අපූරු ආධ්‍යාත්මක වැඩ පිළිවෙලක් ක්‍රියාත්මක කළා. තමන්ගෙනුත් තම අනුගාමිකයින් ගෙනුත් එතුමා ප්‍රථම කොට ආදර්ශය දුන්නා. මග පෙන්වීම දුන්නා. ඒ ආදර්ශය, ඒ මග පෙන්වීම තමයි සේවය සඳහා කැපවීම, පෞද්ගලික ලාභාපේක්ෂාවෙන් තොරවීම, සැහැල්ලු පැවතුම. විශේෂ වරප්‍රසාද භුක්ති වින්දේ නෑ. සෙසු නායකයින්ටත් විශේෂ වරප්‍රසාද බුක්ති විඳීමට අවස්ථාව සැලැස්සුවේ නෑ. එක්තරා විදියක අපිස් ජීවිතයකට හුරු වුනා. නායකයින් භුක්ති වින්දේත් සාමාන්‍ය ජනතාවටත් අඩු තරමෙ වරප්‍රසාද. සාමාන්‍ය ජනතාවට වාහනයක් අයිති කර ගන්න උවමනා නම් එයට අවස්ථාවක් තිබුනත් නායකයින්ට එහෙම අවස්ථාවක්වත් තිබුනේ නෑ. නායකයෝ තමන්ගෙ මුලු කාලයම මුලු ශක්තියම රට ගොඩ ගැනීමේ කාර්යයට කැපකළා. පෞද්ගලික ජීවිතය කියල එකකුයි, දේශපාලන ජීවිතය කියල තව එකකුයි නෑ. චීන නායකයින් අවංක වූ නිසා, ගුණ ගරුක වූ නිසා, නිහතමානි වූ නිසා චීන ජනතාව නායකයින් විශ්වාසයට ගත්තා. ඔවුන් අනුගමනය කළා. ඔවුන්ගේ ඉල්ලීම දේව වාක්‍ය තරම ඉහළින් පිළිගත්තා.

ජනාධිපති කාර්යාලය
පුස්තකාලය

මෙන්න මේ විශ්වාසය ඇතිවෙන්න ඕනෑ. ඒක ඇතිවෙන්න නම් අපි ඔක්කොම අවංක වෙන්න ඕනෑ. විනයගරුක වෙන්න ඕනෑ. පෞද්ගලික ලාභාපේක්ෂාවෙන් තොරවෙන්න ඕනෑ. සේවය සඳහා කැපවෙන්න ඕනෑ. එහෙම නැතුව ගම් හදනවයි කියල ගිහිල්ල ගොඩනැගිලි හදන්න නැයකුට හරි යාලුවකුට බාරදීල දූෂණයෙහි යෙදෙනව නම් ආදර්ශයක් ද ඒක ? අවට මිනිස්සු ඔක්කොටම පේනවා 'මුන් පල් හොරු, මුන්ට මෙ වැඩෙ බාර දීල තියෙන දේශපාලනඥයො මුන්ට වඩා පල් හොරු, මුනුත් හොරු නම් උනුත් හොරු නම් අපිත් හොරු වුනාම මොකද? අපිත් හොරු වෙමු.' සාමාන්‍ය මිනිස්සු හිතන්නෙ ඔහොමයි. ඕං ඔතෙන්ට කොච්චර බණ කිව්වත් වැඩක් නෑ. ඒකම හොර ගුහාවක් ! බස් එකේ වාදෙ. කඩපිලේ වාදෙ. නායකයින්ට පක්ෂ එක්කෙනෙක් මේ විදියට කතා කරනවා. 'නායකයින්ට දෙස් කියන්න එපා. ඒ ගොල්ලන් මොකද කරන්නෙ? මුන්නෙ හොරු !' අනික් එක්කෙනා කියනවා 'ඕව ඉතිං මේ හොරුන්ට සියයට දහයයි ! ඒ හොරුන්ට සියයට පණහයි ! නැත්නම් ඔයි මේ හොරුන්ට මේ විදියේ ගැහිලි ගහන්න ඉඩ දීලා බලා ඉන්නවද ?' මේ අවිස්වාසය බොහොම තැනක තියෙනවා. අන්‍යොන්‍ය විශ්වාසයක් නැතිව කොහොමද ගම් හදන්නෙ ? කොහොමද රට හදන්නෙ? අපි මේව තේරුම් ගන්න ඕනෑ. අපි හිතන විදියට වැඩක් කෙරෙන්නෙ නැත්තෙ මෙකයි. වරද ජනතාව අතේ නෙවෙයි, අපේ අතේ. අවංකකම, විශ්වාසය, කැපවීම, එක තැනක තිබිල වැඩක් නෑ. මෙක සමාජයේ හැම මට්ටමටම කිඳා බහින්න ඕන. ඉහළ සිට පහළට තිබිය යුතු මේ ගුණාංගය සර්වෝදය ව්‍යාපාරයේ තිබෙනවා. ආණ්ඩුවේ දෙපාර්තමේන්තුවකට බාර දෙන්න බලන්න සර්වෝදය ව්‍යාපාරය, කොහොමට හිටිවිද බලන්න ! අපි විපක්ෂයේ ඉන්න කොටත් මේක අගය කළා. දැන් ආණ්ඩුවක් හැටියටත් අගය කරනවා. අපි සර්වෝදයෙන් පාඩම් ඉගෙන ගනිමු.

මගේ කථාවෙන් මං කිව්වට වැඩි දේවල් තේරුම් ගන්න. මගෙ හිතේ තියෙන අදහස් කියන්න මට තියෙන දැන උගත්කම මදි. මට වචන නෑ. මං ඒ අතින් බොහොම දුර්වලයි. මහ විශාල හැඟීම් රාශියක් මගෙ හිතේ තියෙනවා. කියාගන්ට බැරුවයි ඉන්නෙ. මං කියාපු ඒවටත් වැඩිය මේ ගැන හිතන්න. ගැඹුරට හිතන්න. අලුත් අදහස් මට ලියල එවන්න. මං මේ අදහස් කිව්වෙ නව වේගවත්ව නව විධිමත්ව මේ උදගම් වැඩපිළිවෙල ඉදිරියට ගෙනියන්ට ඕන නිසයි. මේ සංකල්පයේ සමාප්තිය තමයි 'මාව කවුරුවත් පාලනය කරන්නේ නෑ, මාව පාලනය කරන්නේ මමමයි. මම ගුණගරුක සත්පුරුෂයකු වුනේ දඩුවමට නීතියට බයෙන් නොවෙයි. යුක්තිය හා මනුෂ්‍යත්වය තේරුම් ගත් නිසයි. අනුන් වෙනුවෙන් කැපවෙච්ච තරමට, අවංක වූ තරමට, හෘදය සාක්ෂියට එකඟව ජීවත් වූ තරමට, මගේ හිත සැහැල්ලුයි, මනුෂ්‍යත්වයේ උතුම්ම සැපත එයයි.' මෙන්න මේ සිතිවිල්ල වගා කරගෙන නිවී සැනසී සිටිය හැකි ලෝකයක් අපි ගොඩ නගමු.

ජනාධිපති ලේකම් කාර්යාලය
26 AUG 2023
පුස්තකාලය

පළාත් පාලන, නිවාස හා ඉදිකිරීම් අමාත්‍යාංශය

ගම හදා රට හදමු

වාර්තා කොට ඉදිරිපත් කළේ

එවන්ස් ගුණලාල් කුරේ

හා

ජයසේන ජයකොඩි

පළාත් පාලන, නිවාස සහ ඉදිකිරීම් අමාත්‍යාංශයේ

ප්‍රවෘත්ති අංශයේ ප්‍රකාශනයකි

---

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුව